## ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ සහ එහි පරිපාලිතය - 2022

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ සහ එහි පරිපාලිතයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. | මුදල් රෙගුලාසි 261(3) | මුදල් පොතෙහි ප්‍රමාණවත් මුදල් නොමැතිව ගෙවීම් සටහන් කිරීම හෝ චෙක්පත් ලිවීම නොකල යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 4,834,607 කින් මුදල් පොතේ ශේෂය ඍන අගයක් වී තිබුණි. | අපගේ බැංකු මුදල්වල ගෙවීම් ප්‍රමාණය සපුරාලීම සඳහා අරමුදල් ලබා දීමට කටයුතු කර ඇති අතර, සමාලෝචිත කාල සීමාව තුළ NIBM එහි අයිරා පහසුකම භාවිතා කර නොමැති අතර NIBM දැඩි මූල්‍ය පාලනයන් පවත්වා ගනිමින් රෙගුලාසි 261 (3) මූල්‍ය කටයුතුවලට අනුකූල වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය |
| ii. | මුදල් රෙගුලාසි 756 | සියළුම රාජ්‍ය ආයතන විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකල යුතු වුවත් ආයතනය විසින් 2022 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | මෙම වසර තුළ සත්‍යාපනය කිරීමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/ 2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.2.5 වගන්තිය, මෙහෙයුම් අත්පොතේ 7.7 වගන්තිය හා 2023.04.19 දිනැතිව විගණකාධිපති ඇමතූ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | ආයතනයේ පරිපාලිත සමාගම වන ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යායතන සමාගමේ ආයෝජන, මූල්‍යායනය, ලාභාංශ හා මානව සම්පත් ප්‍රතිපත්ති ඇතුලත් ප්‍රතිපත්තිමය රාමුවක් සකස් කල යුතු අතර එසේ සකස් කරන තෙක් භාණ්ඩාගාර චක්‍රලේඛ හා මාර්ගෝපදේශ අදාල කර ගැනීමට අවශ්‍ය කටයුතු මව් සමාගම විසින් සිදු කිරීම වඩාත් යෝග්‍ය බව දක්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 1/2021 අනුව පරිපාලිත සමාගමේ ප්‍රතිපත්ති රාමුව පිළියෙල කිරීමට කටයුතු කරනු ලබන බව. | යොමුගත චක්‍රලේඛ හා මාර්ගෝපදේශ අනුව කටයුතු කල යුතුය. |

### 1.6 මුදල් කළමනාකරණය

| | | | |
|---|---|---|---|
| (අ) | ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය විසින් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනයේ ආයෝජනය කර තිබුණු රු.මිලියන 800 ක මුදල සඳහා 2017 වර්ෂයේ සිට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. | ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය බුංවත් භාවය (Solvency Test) පරීක්ෂාවේ දී එම ආයතනය ලාභාංශ ගෙවිය හැකි මට්ටමක නොපවතින බව ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනයේ උපකුලපති විසින් 2022.03.14 දිනැති ලිපිය මගින් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ට අපට ද පිටපතක් සහිතව දන්වා ඇති බව. | යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 02 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී, ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය ලාභාංශ නොගෙවීම සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළඹීම සහ මෙම ආයතන දෙකෙහි හැසිරීම සහ ව්‍යුහය අධීක්ෂණය සඳහා විශේෂඥ මණ්ඩලයක් පත්කරන ලෙස කමිටුව විසින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නියෝගයක් ලබා දී තිබුණද ඒ අනුව කටයුතුකර නොතිබුණි. | පිළිතුර ඉදිරිපත්කර නැත | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග අනුව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.248,837,523 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.837,737,921 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.588,900,398 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ඍජු වියදම් රු. 275,808,886 කින් හා පරිපාලන වියදම් රු. 428,417,999 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

සමූහය, ඉකුත් වර්ෂයේදී සියයට 17.29 ක ශුද්ධ ලාභ අනුපාතයක් උපයාගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේදී එය සියයට 4.36 දක්වා අඩුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය විසින් ගොඩනැගිලි ඉදිකර පාඨමාලා පවත්වාගෙන යනු ලබන කොළඹ හා ගාල්ලේ පිහිටි ඉඩම් 02 ක් සඳහා 2017 හා 2018 වර්ෂවලදී | ගාල්ලේ මධ්‍යස්ථානය පිහිටුවා ඇති ඉඩම සම්බන්ධයෙන් ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම්, ඉඩම් කොමසාරිස් ජනරාල් සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සමග පැවති සාකච්ඡාවලදී එම ඉඩමෙහි හිමිකම නිරවුල් කර දීමට එකඟ වී ඇත. ඒ අනුව ඉදිරි මාසය තුළ එනම් සැප්තැම්බර් වන විට | අයිතිය පවරා ගැනීම් කටයුතු කඩිනමින් සිදු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 85 ක් ගෙවීම් කර තිබුණද, 2023 ජූලි 15 දින දක්වාම එම ඉඩම්වල අයිතිය පවරා ගෙන නොතිබුණි. | එම ඉඩමේ අයිතිය ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයට ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. කොළඹ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම සම්බන්ධයෙන් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් සමඟ කටයුතු කරමින් අදාල පවරා ගැනීමට කටයුතු කරනු ලබන බව. | |
| (ආ) | 2021 දෙසැම්බර් 02 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් විගණකාධිපතිගේ නිරීක්ෂණ සමාලෝචනය කරමින් කළමනාකරණ දෙපාර්තමේන්තුව හා එක්ව දිරිදීමනා ගණනය කිරීම සඳහා පිළිගත හැකි ක්‍රමවේදයක් සකසන ලෙසට උපදෙස් ලබා දී තිබුණද, 2023 ජූලි 15 දින දක්වාම එම කාර්යය නිම කර නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් ආදායම් බදු ගණනය කිරීමේදී ඉවහල් කර ගනු ලැබූ ආදායම, දිරිදීමනා ගණනයේ දී භාවිතා කර ඇති අතර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු නිර්දේශය මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති ක්‍රමවේදයට අනුව දිරි දීමනා ගණනය කර ඇති බව. | රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ අනුව කටයුතු කල යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනයේ අභ්‍යන්තර මෙහෙයුම් කටයුතු පාලනය සඳහා 2016 ජනවාරි මාසයේ සකස්කර 2021 පෙබරවාරි 18 දින සංශෝධනය කර භාවිතයේ පවතින මූල්‍ය හා ගිණුම්කරණ මෙහෙයුම් අත්පොත සඳහා මව් සමාගමේ අනුමැතිය ලබාදී නොතිබුණි. | සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය අනුව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අනුමත කිරීමේ සම්පූර්ණ බලතල තිබේ. එමෙන්ම මව් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයද සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරයි. | මව් සමාගමේ අනුමැතිය ලබාගත යුතුය. |